## පිළිතුරු පත්‍රය

## ඉතිහාසය - I කොටස


❖ **සාධන මට්ටම අනාවරණය කර ගැනීමේ පරීක්ෂණය. 2021 අධ්‍යයන වර්ෂය (2022)**

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01) | 1 | 11) | 4 | 21) | 1 | 31) | 1 |
| 02) | 3 | 12) | 2 | 22) | 4 | 32) | 2 |
| 03) | 4 | 13) | 1 | 23) | 4 | 33) | 3 |
| 04) | 2 | 14) | 1 | 24) | 3 | 34) | 4 |
| 05) | 1 | 15) | 2 | 25) | 2 | 35) | 4 |
| 06) | 2 | 16) | 3 | 26) | 2 | 36) | 4 |
| 07) | 3 | 17) | 4 | 27) | 3 | 37) | 2 |
| 08) | 1 | 18) | 4 | 28) | 1 | 38) | 1 |
| 09) | 2 | 19) | 3 | 29) | 3 | 39) | 3 |
| 10) | 4 | 20) | 3 | 30) | 2 | 40) | 1 |


## II කොටස

## I කොටස

01)(අ) i) ලංකා සිතියමේ ස්ථාන 12 ක් ලකුණු කොට නම් කිරීම (ලකුණු 12 යි)



ii) ලෝක සිතියමේ ස්ථාන 6 ක් ලකුණු කොට නම් කිරීම (ලකුණු 6 යි)




(ආ) (i) A - තිරිවානා ගල්

B - නකදිව

C - අනුරාධපුර අභයගිරි විහාරය

D - සත්මහල් ප්‍රාසාදය (ලකුණු 4 යි)

(ii) 1) පාහියන්ගල ලෙන

2) කළුතර

3) ප්‍රාග් ඓතිහාසික යුගයේ/ ගල් යුගය

4) පහතරට තෙත් කලාපයේ (ලකුණු 4 යි)

(iii) 1) මහනුවර යුගයට

2) පැදුරු විවීමේ කර්මාන්තය

3) දහනවවන සියවස

4) යකඩ, දැව, ලෝහ, ලාක්ෂා, පන් ආදී කර්මාන්ත (ලකුණු 4 යි)

02) (i) ශුෂ්ක කලාපය, අර්ධ ශුෂ්ක කලාපය, තෙත් කලාපය, පහතරට වියළි කලාපය, පහතරට අතරමැදි වියළි කලාපය, කඳුකර වියළි අතරමැදි කලාපය (ලකුණු 1x3 =3 යි)

(ii) වල් දෙල්, කැලෑ කෙසෙල්, ගෝනල, කටුඅල, කිතුල් ඇට, දෝතලු ඇටවල මදය (ලකුණු 1x4 =4 යි)

(iii) • කුඩා ප්‍රමාණයේ ගම්
විශාලත්වය සාමාන්‍යයෙන් හෙක්ටයාර 0.15 පමණ වේ. සාමාන්‍යයෙන් ගමක පවුල් 5 - 6 අතර ප්‍රමාණයක් වාසය කර ඇත.
• විශාල නාගරික ජනාවාස
හෙක්ටයාර දෙකකට වඩා විශාල ය. ඇතැම් විශාල ප්‍රමාණයේ ගම්වල පවුල් තිහක් පමණ වාසය කර ඇත.
• තදානුබද්ධ නාගරික ජනාවාස
මාගම නගරයේ සහ තදානුබද්ධ නාගරික ජනාවාසවල අවම තරමින් 35000 ක ජනගහනයක් විසූ බව සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් වීම.
• නකර
ගමත් නගරයත් අතර වූ ජනාවාසයකි. ගම්වල නිෂ්පාදනය කරන දෑ වෙළඳාම පිණිස මහ නගර වෙත ගෙන යාම සම්බන්ධීකරණය වූයේ මෙම අතරමැදි ජනාවාස වලිනි. (ලකුණු 2+3 =5 යි)

(iv) • දඩයම් කිරීමෙන් සහ තැන තැන ඇවිද ආහාරයට ගත හැකි ස්වාභාවික දේ එකතු කර ගනිමින් සිය ජීවිකාව පවත්වාගෙන යාම.
• කුඩා කණ්ඩායම් ලෙස සංවිධානය වී සිටීම.
• අවමංගල්‍ය චාරිත්‍ර අනුගමනය කිරීම.
• වර්ෂයේ වැඩි කාලයක් සංචාරක ජීවිතයක් ගත කිරීම. ආදිය විස්තර කිරීම. (ලකුණු 3+3 =6 යි)

03) (i) A - කුල B - එල්ලංගාව C - නරේශ්වර/ නරඉසෙර
(ලකුණු 1x3 =3 යි)

(ii) • රට ආර්ථික වශයෙන් දියුණු කිරීම. - වැව් අමුණු ඉදිකර, රට ආර්ථික අතින් සංවර්ධනය කිරීම.
• රට වැසියාගේ ආධ්‍යාත්මික සංවර්ධනය ගොඩ නැගීම. -
වෙහෙර විහාර ඉදි කරමින් රටවැසියාගේ ආධ්‍යාත්මය පෝෂණය කිරීම.
• රට වැසියාට ආරක්ෂාව සැපයීම. -
පරසතුරු උවදුරු අවස්ථාවල දී ආරක්ෂාව සලසා දීම හා ඊට සමාන පිළිතුරු (ලකුණු 1x4 =4 යි)

(iii) • ලෝහ කර්මාන්තය -
මුතුගල්ල නම් ස්ථානයේ සෙල්ලිපියේ මජ්ජිම නම් කම්මල්කරුවකු ගැන සඳහන් වීම.
• රන් කර්මාන්තය -
මණ්ඩගල නම් ස්ථානයේ සෙල්ලිපියක තුලදර සුමන නම් රන්කරුවෙකු ගැන සඳහන් වීම.
• ඇත්දත් කැටම් කර්මාන්තය -
වේගිරිය දේවාලය අසල පිහිටි සෙල්ලිපියක දටික සමුන නම් ඇත්දත් ශිල්පියෙකු පිළිබඳ සඳහන් වීම.
මැණික්, මැටි, රෙදි වැනි කර්මාන්ත පිළිබඳ නිදසුන් (50 - 51 පිටු) (ලකුණු 2+3 =5 යි)

(iv) • රාජ සභාවේ එකගතාව මත පාලන කටයුතු සිදු කිරීම.
• අධිකරණ ක්‍රමයක් පැවැතීම.
• මහලේකම්වරු යටතේ රජයේ කටයුතු ලේඛනගත කිරීම.
• රට පළාත්වලට බෙදා පාලනය කිරීම / පළාත් පාලනය සඳහා රජයට සම්න්ධ වෙන ම පරිපාලන ඒකක පැවතීම.
• පහළ මට්ටමේ පරිපාලන කටයුතු මෙහෙය වීමට ස්වාධීන මණ්ඩල පැවතීම ආදිය (44, 45, 46 පිටු)
(ලකුණු 3+3 =6 යි)

04) (i) මින්නේරිය වැව, ගිරිතලේ වැව, කවුඩුල්ල වැව, කන්තලේ වැව (ලකුණු 1x3 =3 යි)

(ii) A - පීඩන ශල්කනය

B - පූර්ව ඓතිහාසික යුගය

C - දැදිගම සූතිඝර චෛත්‍යය

D - මඩ සොරොව්ව (ලකුණු 1x4 =4 යි)

(iii) A. • උෟරාකැට ළිං

• ළිඳ හාරා ඒ තුළට විශාල ප්‍රමාණයේ මැටි බඳුන් කිහිපයක් බස්සවා, එහි බිත්ති ආවරණය කිරීමෙන් එම ළිං සාදා ගෙන ඇත. (ලකුණු 2 යි)

B. අඩි 600කට ආසන්න උසක සිට කාණු පද්ධතියක් හරහා තැනිතලාවට ගලා එන ජලය හිරිවන ම හරස්කොට සැලකිය යුතු තරමේ පීඩනයක් ඇති කිරීමෙන් ජලය ඉහළට එසවීම. (එම අදහස එන පිළිතුරක් ප්‍රමාණවත් වේ. - 68 පිටුව) (ලකුණු 3 යි)

(iv) • සකපෝරුව භාවිත කිරීම.

• කාලරක්ත වර්ණ මැටි බඳුන් නිපදවීම.

• මැටි බඳුන් වර්ණ ගැන්වීම හා ඔප දැමීම.

• වර්තමාන උසස් වර්ගයේ පිඟන් භාජන සෑදීමට මැටි සකස් කර ගන්නා ආකාරයට සමාන ව මැටි සකස් කර ගැනීම. ආදිය විස්තර කර තිබීම. (ලකුණු 3+3 =6 යි)

05) (i) A - කැඳ

B - ආහාර පිසීමට යොදා ගන්නා තෙල්

C - ආහාර රසවත් කිරීමට යොදා ගන්නා කුළුබඩු (ලකුණු 1x3 =3 යි)

(ii) A. - කිසිඳු සතෙකු නොමැරිය යුතු ය.

B. - අපරාධකරු අල්ලා ගන්නා තුරු ඔහු ජීවත් වූ ගමේ වැසියන් විසින් රජයට ගෙවිය යුතු වූ බද්ද (ලකුණු 2+2 =4 යි)

(iii) • හතරවන මිහිඳු රජතුමා විසින් පිහිටුවන ලද අනුරාධපුර පුවරු ලිපියේ ''උස් ගොඩබිම් ඉඩම්වල කැලෑ නොකැපිය යුතුයි.'' යනුවෙන් නියෝග කර තිබීම.

• තුන්වන උදය රජු විසින් පිහිටුවන ලද බුද්ධන්නෙහෙල ස්ථානයේ සෙල්ලිපියේ ''කැලෑවල ගස්කොළන් නොකැපිය යුතු'' බවට සඳහන් කර තිබීම.

• පස්වන කාශ්‍යප රජු විසින් පිහිටුවන ලද කොණ්ඩවට්ටවාන් ටැම් ලිපියේ ගස් කොළන් කළමනාකරණයේ දී රජය විසින් පනවා තිබෙන නීති රීතිවලට අනුකූල ව ක්‍රියා කරන ලෙස රජයේ නිලධාරීන්ට උපදෙස් දී තිබීම. ආදී නිදසුන් ඉදිරිපත් කරමින් විස්තර කිරීම.

(ලකුණු 2+3 =5 යි)

(iv) A. • චූලසීවලි දේවි නමින් හැඳින් වූ මහ රැජිණක් පිළිබඳ සඳහන් වන සෙල්ලිපියක් නිල්ගිරි සෑය ස්තූපය අසලින් හමු වීම.

• ලීලාවතී රැජිණ තෙවරක් මෙරට පාලනය කිරීම.

B. • ස්වාමියා දුර රටක වෙළෙඳ කටයුතුවල නියැලී වසර තුනකින් නැවත පැමිණෙන තුරු හුදකලාව කාලය ගත කළ කාන්තාවක් පිළිබඳ විස්තර රසවාහිනියේ සඳහන් වීම.

• තලතා ලක්ෂ්මී නම් කාන්තාවක් තමාගේ පවුලේ දේපලවලින් කොටසක් බෞද්ධ විහාරයකට පූජා කිරීම.

C. • කාන්තාවක ප්‍රාදේශීය පාලන කටයුතුවල නියැලී සිටීම. එසේ ප්‍රාදේශීය පාලනයේ නියැලුන පරුමකලු සුමනා නම් කාන්තාවක් පිළිබඳ බ්‍රාහ්මණයාගම නම් ස්ථානයේ සෙල්ලිපියක සඳහන් වීම. (ලකුණු 3x3 =6 යි)

06) (i) වීදි, වෙළෙඳපොළවල්, ආගමික ගොඩනැගිලි, සෞන්දර්යාත්මක උද්‍යාන, ආරක්ෂක ප්‍රාකාර, ජලාශ

(ලකුණු 1x3 =3 යි)

(ii)
- පීඩාවට පත් භික්ෂූන් වහන්සේලා ඇතුළු ජනතාව ආරක්ෂාව පතා රුහුණට, මලය රටට (කඳුකරයට) හෝ මායා රටට සංක්‍රමණය වීම.
- රජරට බොහෝ ප්‍රදේශ ජන ශූන්‍ය වීම.
- වන්නි ප්‍රදේශ බිහි වීම.
- අනුරාධපුර බොහෝ ස්ථූප වල් බිහි වීම.
- රජරට ප්‍රදේශයේ ජනාකීර්ණව පැවති නගර බොහොමයක් නටඹුන් බවට පත් වීම.

(ලකුණු 1x4 =4 යි)

(iii)
- මහ වැව් හා වාරි මාර්ග ඉදි කිරීමට වැඩි අවධානයක් යොමු නොකිරීම.
- ප්‍රධාන ජීවනෝපාය කෘෂි කර්මාන්තය වීම.
- ක්‍රමයෙන් වාණිජ ආර්ථික රටාවකට නැඹුර වීම.
- විදේශීය වෙළඳාම වර්ධනය වීම.
- සරුසාර අභ්‍යන්තර වෙළඳාමක් පැවතීම ආදී කරුණුවලින් දෙකක් විස්තර කර තිබීම.

(ලකුණු 2+3 =5 යි)

(iv)
- සමකාලීන ව මෙරට වෙනත් රාජධානී කිහිපයක් පැවතීම. (දැදිගම, යාපනය, රයිගම)
- ගම්පොළ රජ පරපුර සමඟ සබඳතා ගොඩ නගාගෙන සිටි කැපී පෙනෙන ප්‍රභූ පවුල් දෙකක් සිටීම.
- රජකම මාමාගෙන් පසු බෑණාට රජකම හිමි වීම.
- චීන ආක්‍රමණ මෙරටට එල්ල වීම. ආදිය හා ඊට සමාන කරුණු තුනක් විස්තර කර තිබීම.

(ලකුණු 3+3 =6 යි)

07) (i) සෙනරත් රජු, දෙවන රාජසිංහ රජු, දෙවන විමලධර්මසූරිය රජු, ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු

(ලකුණු 1x3 =3 යි)

(ii)

| | | |
|---|---|---|
| දන්තුරේ | - | පේරෝ ලෝපෙස් ද සූසා |
| බලන | - | දොන් ජේරනිමෝ ද අසවේදු |
| රන්දෙණිවල | - | කොන්ස්තන්තීනු ද සා |
| ගන්නෝරුව | - | දියෝගෝ ද මෙලෝ |

(ලකුණු 2+2 =4 යි)

(iii)
- ශ්‍රී ලංකාව කෝට්ටේ, උඩරට හා යාපනය වශයෙන් කොටස් තුනකට බෙදී තිබීම.
- කෝට්ටේ රාජ්‍ය කොටස් තුනකට බෙදී යාම. (විජයබා කොල්ලය) ආදී කරුණු විස්තර කර තිබීම.

(ලකුණු 2+3 =5 යි)

(iv)
1. පෘතුගීසින් මෙරටින් පලවා හැරීම.
   - 1638 දී ලන්දේසි සහය ලබාගෙන වර්ෂ 1658 වනවිට පෘතුගීසින් මෙරටින් පලවා හැරීම.
2. පෘතුගීසින්ගෙන් උඩරටට එල්ලවන ප්‍රහාර මැඩ පැවැත්වීම.
   - ඌව රන්දෙණිවල සටනේ මෙන් ම 1638 ගන්නෝරු සටනේ දී ද පෘතුගීසින් අන්ත පරාජයකට පත් කිරීම.
3. ලන්දේසි බලපෑමෙන් උඩරට නිදහස් කර ගැනීම.
   - 1665 - 1668 කාලයේ දී ලන්දේසීන් උඩරට ප්‍රදේශ රැසක් අල්ලා ගැනීම.
   - 1670 - 1675 කාලයේ දී ලන්දේසීන්ට එරෙහි ව ප්‍රදේශ රැසක් අල්ලා ගැනීම.

(ලකුණු 3+3 =6 යි)

4. උඩරට රාජධානියේ බලය ව්‍යාප්ත කිරීම.
   - පෘතුගීසින්ගෙන් අල්ලා ගන්නා ලද ප්‍රදේශ කිහිපයක් අත්පත් කර ගැනීම ආදි කරුණු විස්තර කිරීම.

## III කොටස

08) (i) මයිකල් ආන්ජලෝ, ලියනාඩෝ ඩාවින්චි, රෆායල් සැන්ඩි (ලකුණු 1x3 =3 යි)

(ii) පෘතුගාලය - හෙන්රි කුමරු (නාවික හෙන්රි)

ස්පාඤ්ඤය - ෆර්ඩිනන්ඩ් හා ඉසබෙලා කුමරිය (ලකුණු 2+2 =4 යි)

(iii)

| මධ්‍යතන යුගයේ ගෘහ නිර්මාණ ශිල්පයේ ලක්ෂණ | පුනරුද සමයේ ගෘහ නිර්මාණ ශිල්පයේ ලක්ෂණ |
|---|---|
| • උල් කේතු ආකාර හැඩයෙන් යුත් ආරුක්කු<br>• උස් වහල<br>• පිරමීඩ හැඩයේ කුළුණු | • රෝම ගෘහ නිර්මාණ ශිල්පය අනුව වටකුරු ආරුක්කු<br>• අර්ධ ගෝලාකාර ශිඛර<br>• සුඛෝපභෝගී මන්දිර තැනීම. |

ආදී කරුණු සංසන්දනාත්මක ව විස්තර කර තිබීම.

(ලකුණු 2+3 =5 යි)

(iv) A. පෙර අපර දෙදිග වෙළඳ කටයුතුවලට බාධා ඇති වීම. මුහුද හා ගොඩබිම් මාර්ග තුර්කි අධිරාජ්‍යය යටතට පත් වීම. එම නිසා ආසියාතික භාණ්ඩ ලබා ගැනීම සඳහා පෙරදිගට ළඟා විය හැකි නව මුහුදු මාර්ග සෙවීමට යුරෝපීයන් පෙළඹීම.

B. • බර්තෝලමියුඩයස් - කුණාටුවකට හසු වීම නිසා අප්‍රිකාවේ දකුණු තුඩුවට පැමිණ එය කුණාටු තුඩුව ලෙස නම් කිරීම.

• වස්කෝ ද ගාමා - බර්තෝලමියුඩයස් ගිය ගමන් මග ඔස්සේ ගමන් කර ඉන්දියාවේ කැලිකට් වරායට පැමිණීම.

(ලකුණු 3+3 =6 යි)

09) (i) වෙළෙන්දන්, බැංකුකරුවන්, නැව් හිමියන්, තවලම් හිමියන් (ලකුණු 1x3 =3 යි)

(ii) සාහිත්‍ය, ඉතිහාසය, කලාව, නීතිය, ආචාර විද්‍යාව (ලකුණු 1x4 =4 යි)

(iii)
- ග්‍රීක හා ලතින් භාෂා ඉගෙනීම ජනප්‍රිය වීම.
- සාහිත්‍යයේ නව ප්‍රබෝධයක් ඇති වීම.
- ගත් කතුවරු රාශියක් බිහි වීම.
- ග්‍රන්ථ රාශියක් ලියවීම.

ආදී කරුණුවලින් දෙකක් කෙටියෙන් විස්තර කර තිබීම. (ලකුණු 2+3 =5 යි)

(iv) 1. නිකලස් කොපර්නිකස්

- පෘථිවිය ගෝලාකාර බවත්, අනෙකුත් ග්‍රහයන් සූර්යයා වටා පරිභ්‍රමණය වන බවත් සොයා ගැනීම.

2. අයිසෙක් නිව්ටන්

- ගුරුත්වාකර්ෂණ නියමය සොයා ගැනීම.

3. ජොහැන්ස් කෙප්ලර්

- කොපර්නිකස් ඉදිරිපත් කළ අදහස් තහවුරු කොට, ඒවා තවදුරටත් ඉදිරියට ගෙන යමින් සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක සූර්යයා වටේ ඉලිප්සාකාර ව ගමන් ගන්නා බව සොයා ගැනීම.

(ලකුණු 3+3 =6 යි)